# සාමාන්‍ය සමයේ දස සත් වන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය 1 රාජාවලිය 3: 5, 7–12

*රාජාවලියේ පළමුවන පොතෙන් උපුටා ගත් කොටසකි.*

"ඔබ මගෙන් ඉල්ලා සිටියේ ඥානයය.
එම ඉල්ලීම ලෙස මම ඉටු කරමි."

ගිබ්යොන්හි දී සමිඳාණන් වහන්සේ රාත්‍රියේ ස්වප්නයකින් සලමොන්ට දර්ශනය වූ සේක. තවද, දෙවියන් වහන්සේ කතා කොට, "මා නුඹට දිය යුතු දෙය ඉල්ලන්නැ"යි වදාළ සේක.

සලමොන් කතා කොට, "දැනුදු මාගේ දෙව් සමිඳුනි, ඔබ මාගේ පිය වූ දාවිත් වෙනුවට ඔබේ දාසයා රජ කොට පත් කළ සේක. මම ළා බාල කෙනෙක්මි, රට පාලනයේ දක්ෂකමක් මට නැත. ගණන් කළ නොහැකි අසංඛ්‍ය සමූහයක් වන ඔබ විසින් තෝරා ගනු ලැබූ ඔබේ සෙනඟ මැද ඔබේ දාසයා සිටියි. එබැවින් ඔබේ මේ සෙනඟ විනිශ්චය කරන පිණිස, හොඳ නරක දැනගන්න පුළුවන් වන ලෙස ඥානවන්ත සිතක් ඔබේ දාසයාට දුන මැනව. මන්ද, ඔබේ මේ මහා සෙනඟ විනිශ්චය කරන්න කවරෙකුට පුළුවන්දැ"යි කීවේ ය.

සලමොන් මේ දේ ඉල්ලූ නිසා සමිඳාණන් වහන්සේ ඊට ප්‍රසන්න වූ සේක. දෙවියන් වහන්සේ කතා කොට, "නුඹ දීර්ඝායුෂ ඉල්ලන්නේ වත්, ධන සම්පත් ඉල්ලන්නේ වත්, නුඹේ සතුරන්ගේ ජීවිතය ඉල්ලන්නේ වත් නැති ව, විනිශ්චය තේරුම් ගැනීමට ඥානය ඉල්ලූ බැවින් බලන්න, මම නුඹේ ඉල්ලීම ලෙස ඉටු කරමි. නුඹට සමාන කෙනෙකු නුඹට පළමුවෙන් සිටියේ වත්, නුඹට පසු ව සිටින්නේ වත් නැති වන ලෙස තියුණු නැණ නුවණ නුඹට දෙමි"යි ඔහුට වදාළ සේක.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 119: 57, 72, 76, 77, 127–130

පිළිතුර : සමිඳුනි, ඔබේ ආඥාවන්ට මම ප්‍රේම කරමි.

ගීය : සමිඳුනි, මාගේ එකම සම්පත ඔබ ය:
ඔබේ නියෝග පවත්වන්නට පොරොන්දු වෙමි.
ඔබ වදාළ ව්‍යවස්ථාව මසුරන් දහසකට වඩා මට අගේ ය.
ඔබේ මෙහෙකරුවාට ඔබ පොරොන්දු වූ පරිදි
ඔබේ මහ කුළුණු ගුණය මාගේ සැනසීම පිණිස වේ වා!

මා ජීවත් වන පිණිස මට අනුකම්පා කළ මැනව.
ඔබේ ව්‍යවස්ථාව මාගේ ප්‍රීතිය වේ.
එබැවින් රනට වඩා, එසේය, පෙරූ රනට වඩා
ඔබේ ආඥාවලට මම ප්‍රේම කරමි.
එබැවින් ඔබේ නියමය අනුව මම හැසිරෙන්නෙමි:

සියලු වංක මාර්ග නුරුස්සමි.
ඔබේ අණ පණත් විශ්මයජනක ය.
එබැවින් මාගේ මුළු සිතින් මම ඒවා පිළිපදින්නෙමි.
ඔබේ වචන පැහැදිලි වන විට ආලෝකය ලැබේ.
එයින් අනුවණයන්ට නුවණ ලැබේ.

## දෙවන දේව ප්‍රකාශනය රෝම 8: 28–30

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් රෝමවරුන්ට ලියන ලද හසුනෙන් උපුටා ගත් කොටසකි.*

"දෙවියන් වහන්සේ ස්වකීය පුත්‍රයාණන්ගේ ස්වරූපයට
සමාන වන පිණිස අප කැඳවා ගත් සේක."

තවද දෙවියන් වහන්සේගේ අදහස ලෙස කැඳවනු ලැබූවන්ට, එනම්, උන් වහන්සේට ප්‍රේම කරන අයට, සියල්ලෙහි දී ම උන් වහන්සේ ඔවුන්ගේ යහපත පිණිස ක්‍රියා කරන බව අපි දනිමු. මන්ද, උන් වහන්සේ කලින් තෝරා ගත් අය ස්වකීය පුත්‍රයාණන්ගේ ස්වරූපයට සමාන වන පිණිස කල් තියා වෙන් කරගත්

සේක. එසේ කළේ තමන් වහන්සේගේ පුත්‍රයාණන් බොහෝ සොහොයුරන් අතර ජ්‍යෙෂ්ඨයාණන් වන පිණිසය. එසේ, කලින් තෝරා ගත් අය උන් වහන්සේ කැඳවා ගත් සේක. කැඳවා ගත් අය උන් වහන්සේ දමිටු බවට පැමිණෙවූ අය උන් වහන්සේ මහිමයට පැමිණෙවූ සේක.

*දේව වචනය මෙසේ ය.*

## සුපුවත් ජය නද මතෙව් 11: 25

ආලේලූයා! ආලේලූයා!
ස්වර්ගයටත් පොළොවටත් ස්වාමින් වන පියාණන් වහන්ස,
ඔබ වහන්සේ මේ කරුණු පැණවතුන් හා
නැණවතුන් කෙරෙන් ආවරණය කොට,
බාලයන්ට අනාවරණය කළ හෙයින් ඔබට තුති පුදමි.
ආලේලූයා!

## සුවිශේෂය මතෙව් 13: 44–52 හෝ 13: 44–46

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

"ඔහු තමා සන්තක සියල්ල විකුණා ඒ කෙත මිල දී ගත්තේ ය."

"ස්වර්ග රාජ්‍යය, කෙතක සඟවා තිබුණු නිධානයකට සමාන ය. එක්තරා මිනිසකුට එය සම්බ විය. ඔහුත් එය සඟවා තබා මහත් ප්‍රීතියෙන් ගොස් තමා සන්තක සියල්ල විකුණා ඒ කෙත මිල දී ගත්තේ ය.

ස්වර්ග රාජ්‍යය, අගනා මුතු සොයා ගිය වෙළෙන්දෙකුට සමාන ය. ඉතා අගනා මුතු ඇටයක් සම්බ වූ විට ඔහු ගොස් තමා සන්තක සියල්ල විකුණා එය මිලට ගත්තේ ය.

(ස්වර්ග රාජ්‍යය වනාහි, මුහුදේ හෙළන ලද, සියලු වර්ගවල මසුන් හසුකර ගත් දැලකට සමාන ය. ඒ දැල පිරුණු කල, ධීවරයෝ එය වෙරළට ඇද, හිඳගෙන,

හොඳ මසුන් භාජනවලට එකතු කොට නරක මසුන් ඉවත දැමූ හ. යුගාන්තයේ දී එසේ ම වන්නේ ය. දේව දූතයෝ නික්ම අවුත්, දැමිටුන් කෙරෙන් අදැමිටුන් වෙන් කොට, අදැමිටුන් ගිනි උඳුනෙහි හෙළන්නෝ ය. එහි වැළපීම ද දත්මිටි කෑම ද වන්නේ ය.

ඔබ මේ සියල්ල වටහා ගත්තහු දැ"යි උන් වහන්සේ ඇසූ සේක. "එසේ ය"යි ඔව්හු කීහ. එවිට උන් වහන්සේ ඔවුන්ට කතා කොට, "එහෙයින් ස්වර්ග රාජ්‍යයෙහි ගෝලයකු බවට පත් වන යම් විනයධරයෙක් වේ ද, ඔහු සිය ගබඩාවෙන් නවීන දේත්, පැරණි දේත් පිටතට ගෙනෙන ගෘහ මූලිකයෙකුට සමාන ය"යි වදාළ සේක.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*

*(වරහන් අතර කොටස අත් හළ හැකි ය.)*